# බළන්ගොඩ නගර සභාව

## 2021-03-16 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.03.16**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - පී.ඩී.ඒ.සේමපාල මිය

අද දින විශේෂ මහ සභාවේ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලය, ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරීතුමිය ඇතුලු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව අද දින විශේෂ මහ සභාව පැවැත්වීමේ අරමුණ පැහැදිලි කරන ලදී. එනම් පළාත් පාලන කොමසාරිස්ගේ CLG/LG/1/10/2 හා 2021.03.12 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.01.21 දින අංක 2211/57 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් මඟින් 2021 වර්ෂයේ පුනරාවර්ථන වියදම් දැරීමට බලය ලබා දී ඇත්තේ නගර සභාවට බැවින් අත්‍යවශ්‍ය කටයුතු පවත්වාගෙන යෑමට පුනරාවර්තන වියදම් දැරීමට පෙර මාසික මහ සභාවේ අනුමැතිය ලබා ගත යුතු බව දන්වා ඇත. එබැවින් "බළන්ගොඩ නගර සභාවේ පුනරාවර්තන වියදම් දැරීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම" සඳහා අද දින විශේෂ මහ සභාව කැඳවන ලද බව දන්වන ලදී.

ඒ අනුව 2021 වර්ෂයේ බළන්ගොඩ නගර සභාව විසින් මහජනතාව වෙනුවෙන් කළ යුතු සියලුම වැඩ කටයුතු ආවරණය වන පරිදි අත්‍යවශ්‍ය කටයුතු ඉටු කිරීම සඳහා අනුමැතිය ලබා ගත යුතු බවද එහිදී ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු ව්‍යාපෘති හා ඊට සම්බන්ධ කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීමේ පහත සඳහන් යෝජනාවලිය ඉදිරිපත් කරන අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙස ද පවසන ලදී.

01. පරිපාලන හා මූල්‍ය කටයුතු පවත්වාගෙන යාම - එනම් සභාවේ සියලුම පරිපාලන කටයුතු සේවක පඩිනඩි, සේවකයින් අවශ්‍ය ස්ථානවලට ස්ථානගත කිරීම, ඒවා අධීක්ෂණ කටයුතු ලිය කියවිලි කටයුතු, පළාත් සභාව සමඟ සම්බන්ධීකරණ කටයුතු, නඩු කටයුතු ආදී අවශ්‍යතාවයන් පවත්වාගෙන යාම මේ සඳහා ඇතුළත් වන බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

02. ආදායම් අය කිරීමේ කටයුතු ඉටු කිරීම. - නගර සභාව සම්පූර්ණයෙන් පවත්වාගෙන යනු ලබන්නේ පුරවැසියන්ගෙන් අය කරන බදු මුදල් වලින් බවද එම බදු මුදල් නිසි වේලාවට නිසි කලට එකතු කර ගනිමින් ඒවාට සාපේක්ෂව මහජනතාවට එදිනෙදා ජීවත්වීම සඳහා අවශ්‍ය කරන අත්‍යවශ්‍ය සේවා ඉටු කිරීමට එකතු කරන ලද බදු මුදල් යෙදවීම වෙනුවෙන් බදු මුදල් එකතු කිරීමට අවශ්‍ය බව පවසන ලදී.

03. පුහුණු කිරීමේ කටයුතු - නිරන්තරයෙන් නව ව්‍යාපෘති පුහුණු වැඩසටහන් රජය මඟින් ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා සභාවේ නිළධාරීන් සහභාගි වන විට නිළධාරීන්ට ගෙවීම, සම්පත් දායක දීමනා ගෙවීම ඒවා සඳහා වන ප්‍රවාහන කටයුතු ආදී වන වියදම් මේ සඳහා අන්තර්ගත වන බව පවසන ලදී.

04. කොවිඩ් 19, ඩෙංගු ඇතුලු බෝවන සහ බෝ නොවන රෝග වැළැක්වීමට අදාළ කටයුතු ඉටු කිරීම. - මෙය සභාව සතු සම්පූර්ණ වගකීමක් වන බව පවසන ලදී.

05. ආයුර්වේද බෙහෙත් ශාලාවේ කටයුතු පවත්වාගෙන යාම - මෙය අනිවාර්යයෙන් ප්‍රජාව වෙනුවෙන් නගර සභාව විසින් ඉටුකළ යුතු කාර්යයක් වන බව පවසන ලදී.

06. නගරයේ ආහාර පරීක්ෂා කිරීම් ඇතුලු ආහාර පිළිබඳව සෞඛ්‍ය ආරක්ෂාව සැලසීමේ කටයුතු - සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා එක්ව ප්‍රදේශයේ ජනතාවට සෞඛ්‍ය සම්පන්නව ආරක්ෂාකාරීව ආහාර ලබා දීම නගර සභාවේ අනිවාර්යය වගකීමක් වන බව පවසන ලදී.

07.නගරයේ කාණු පිරිසිදු කිරීම. - මෙය අත්‍යවශ්‍ය සේවාවක් බව පවසන ලදී.

08. මාතෘ හා ළඳරු සෞඛ්‍ය කටයුතු පවත්වාගෙන යාම හා සෞඛ්‍ය අධ්‍යයන කටයුතු සිදුකිරීම - මෙයද අත්‍යවශ්‍ය සේවාවක් බව පවසන ලදී.

09. ඝන අපද්‍රව්‍ය එකතු කිරීම, කසළ කළමනාකරණය, පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය හා කොම්පෝස්ට් නිපදවීමට අදාළ කටයුතු - සම්පූර්ණයෙන්ම නගරයේ සනීපාරක්ෂක කටයුතු වලින් වැඩි කොටසක් සිදු වනුයේ මේ යටතේ වන බවද කසළ එකතු කිරීම, කාණු ශුද්ධ පවිත්‍ර කිරීම, කසළ වෙන් කිරීම, කොම්පෝස්ට් සෑදීම, ඒවාට අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය අවශ්‍ය ස්ථානවලට ප්‍රවාහනය කිරීම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවකයින්ගේ මාසිකව සිදු කරන වෛද්‍ය පරීක්ෂණ කටයුතු, ඔවුන්ට ලබා දෙන ආරක්ෂක අංගෝපාංග එනම් බූට්ස් ග්ලවුස් ආදිය ලබා දීම ආදිය සිදු කිරීම මේ යටතට ගැනෙන බව පවසන ලදී.

10. පරිසර සංරක්ෂණ කටයුතු හා සුසානභූමි පවත්වාගෙන යාමට අදාල සියලු කටයුතු - සුසාන භූමි නඩත්තු කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ නගර සභාව මඟින් වන අතර එය සභාව මඟින් ඉටු කරන යුතුකමක් හා වගකීමක් වන බව පවසන ලදී.

11. මාර්ග හා කාණු නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම. - මාර්ග කාණු ඉදි කර ප්‍රදේශවාසීන්ට පහසුකම් සැලසීම නගර සභාවක් විසින් අනිවාර්යයයෙන්ම කළ යුතු කාර්යයක් බවද නගරයේ සියලුම මාර්ග නඩත්තු කර නිසියාකාරයෙන් පවත්වාගෙන යාම සභාව සතු වගකීමක් බව ද පවසන ලදී.

12. ගොඩනැඟිලි නඩත්තු හා අලුත්වැඩියා කටයුතු පවත්වාගෙන යාම.

13. පොදු වෙළෙඳසැල, බස්නැවතුම්පල, මහජන පොළ ඇතුලු සභාව සතු සියලුම කඩකාමර පවත්වාගෙන යාමට අදාල කටයුතු.- මහජන පොල, පොදු වෙළෙඳසැල, බස්නැවතුම්පල, කාර්පාක්, වෙළෙඳ මධ්‍යස්ථානය, මැණික් කඩ කාමර, විවෘත කඩ කාමර ආදී සියලු දේ නඩත්තු කරමින් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වියදම් මේ සඳහා ඇතුළත් වන බව පවසන ලදී.

14. වීථි ආලෝක කිරීමේ කටයුතු - නගර සභාව සතු සියලුම පාරවල්වල මහජනතාවට ආරක්ෂාව සැලසෙන පරිදි අවශ්‍ය ස්ථානවල විදුලි බුබුලු සවි කිරීම හා ඒවා නිසි පරිදි නඩත්තු කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා යන වියදම් මේ සඳහා අදාළ වන බව පවසන ලදී.

15. පුස්තකාලය, ක්‍රීඩාපිටිය හා පෙර පාසල් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු. -

16. ශිෂ්‍යාධාර, වැසිකිළි ආධාර, නිවාස ආධාර ඇතුලු මහජන ආධාර හා සහන සැලසීමට අදාල කටයුතු පවත්වාගෙන යාම

ඉහත ව්‍යාපෘති හා කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් අදාල වන්නාවූ,

- පුද්ගලික පඩිනඩි (ස්ථිර, අනියම්, ආදේශක, කොන්ත්‍රාත්) මන්ත්‍රී දීමනා ඇතුලු සියලුම දීමනා
- අතිකාල දීමනා, නිවාඩු දින වැටුප් හා ගමන් වියදම්.
- ඉන්ධන, ලිපිද්‍රව්‍ය, බෙහෙත්, ඉදිකිරීමේ අමුද්‍රව්‍ය ඇතුලු සියලුම ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමේ වියදම්
- වාහන, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ඇතුලු සියලුම නඩත්තු හා අලුත්වැඩියා වියදම්.
- විදුලිය, ජලය, දුරකථන ගාස්තු, කසල එකතු කිරීමේ ගාස්තු, මුද්‍රණ කටයුතු, ගිනි නිවීමේ උපකරණ පවත්වාගෙන යාම ඇතුලු සියලු උපයෝගී සේවා වියදම්.
- ආධාර මුදල්, දායක මුදල් හා සහන සැලසීමට අදාල සියලු වියදම්
- විශ්‍රාම දායක මුදල්
- LLDF ආයතනයට ගෙවන ණයවාරික හා පොලී මුදල්ගෙවීම

මීට අමතරව ආපදාණය, කාර්යසාධන ණය, උත්සව අත්තිකාරම් ඇතුලු සියලුම ණය වර්ග ලබාදීම.

ඉහත සඳහන් යෝජනාවලිය ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරමින් මෙම යෝජනාවලිය ස්ථිර කරන ලෙස පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් මෙහි පළමු කාරණාව වන පරිපාලන හා මූල්‍ය කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ විස්තර කරන ලෙස පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම යෝජනාව ස්ථිර කරගනිමින් ඉදිරියට සාකච්ඡා කිරීම සුදුසු බව පවසන ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ගරු සභාපතිතුමන් විසින් කළ ඉහත යෝජනාව ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් පරිපාලන හා මූල්‍ය කටයුතු පවත්වාගෙන යාම යටතට සුළු සේවකයාගේ සිට ගරු සභාපතිවරයා දක්වා පරිපාලනයට සම්බන්ධ සියලුම වියදම් මේ යටතට අන්තර්ගත වන බවද එනම් සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය වල සිට නිළධාරීන්ගේ අවශ්‍ය කටයුතු වලට ප්‍රවාහන කටයුතු සිදු කිරීම, පරිපාලනයට අදාලවන සියලු දේ අධීක්ෂණයට, පැමිණිලිවලට පෙනී සිටීම්වලට යාමට ආදී දේ මේ සඳහා අදාළ වන බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම සභාවේ පවතින අර්බුදකාරී තත්ත්වය තවම නිම වී නොමැති බව තමන් විශ්වාස කරන බවද කෙසේ වුවත් ගරු සභාපතිතුමාට විරුද්ධ වී අයවැය පරාජය කර තිබෙන මොහොතක අයවැය සම්මත වී ඇත්ද නොමැතිද යන්න මේ වන තෙක් නොදන්නා අතර එය නීතිපතිතුමාට යවා ඇති බවද ඒ කෙසේ වෙතත් දැනට කොමසාරිස්තුමා සභාවට බලය පවරා ඇති බැවින් තමන් මෙම ගරු සභාවට යෝජනාවක් ගෙන එමින් මෙම සභාවේ ස්ථිර සේවකයින්ගේ වැටුප් පඩි නඩි ආදිය ගෙවීම හැර ඉතිරි යෝජනා සියල්ල ප්‍රතික්ෂේප කරන බවට කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, මෙහි දී සිදුවන්නේ සම්පූර්ණයෙන්ම සභාවේ සිටින ස්ථිර සේවකයින්ගේ පඩි නඩි ආදිය ගෙවීමක් පමණක් වන අතර සභාවේ ජල හා විදුලි බිල්, ලිපි ද්‍රව්‍ය, සනීපාක්ෂක කටයුතු සභාව තුළ සිදු කරන සියලු දේ ද මහජනතාව වෙනුවෙන් ඉටු කරන සියලුම සනීපාරක්ෂක කටයුතු , කසළ එකතු කිරීම, පොදු වැසිකිළි සම්බන්ධව ඇති සියලුම සේවා, පුස්තකාල සේවා, පෙර පාසල් කටයුතු හා මාර්ග නඩත්තු කටයුතු අද සිට නැවැත්වීමට සිදු වන බවද මහජනතාව වෙනුවෙන් අනිවාර්යයයෙන් කළ යුතු මෙම සේවාවන් කිරීමට ආයතනය වගකීමෙන් බැඳී සිටින බවද සෞඛ්‍ය හා මහජන උපයෝගීතා සේවා අනිවාර්යයෙන් ඉටු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා පළාත් පාලන පනතින් බලය ලැබී තිබෙන අතර සභාපති කවුරු සිටියද ඒවා අනිවාර්යයෙන් කළ යුතු දේවල් වන බව ද පැවසීය.

එමෙන්ම සභාවේ අර්බුදකාරී තත්ත්වයක් ඇති කළේ තමාව හෝ සභාවේ නිළධාරීන් හෝ බළන්ගොඩ නගරයේ සිටින පුරවැසියන් නොවන අතර මෙය ඇති කළේ කුහක දේශපාලනය විසින් බව ද ගරුආණ්ඩුකාරතුමාගේ ගැසට් පත්‍රය මගින් තමාව ඉවත් කළ සැනින් උප සභාපතිවරයාට අවශ්‍ය කරන බලතල අතපය දිගහැර ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබා දුන් බවද තමාට ලබා නොදුන් ලක්ෂ 05 දක්වා වූ මුදල් වියදම් කිරීමේ බලය ගරු උප සභාපතිතුමාට ලබා දුන් බවද පවසන ලදී.

තවදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසුවේ නැවත වතාවක් අධිකරණයේ තීන්දුවක් ලබා දී තිබියදී එම අධිකරණ තීන්දුව හෑල්ලුවට ලක්කරමින් පළාත් පාලන පනත අභියෝගයට ලක් කර, නැති බලයක් යොදා බළන්ගොඩ ප්‍රදේශයේ මහජනතාව බිල්ලට ගැනීම සම්බන්ධයෙන් තමන් විරුද්ධ වන බවද ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා ගෙන ආ යෝජනාවට තමන් සම්පූර්ණයෙන් විරුද්ධ බවද පවසන ලදී. අප මහජනතාවගේ ඡන්දයෙන් පැමිණ ඇති අතර මහජනතාව සභිකයින් නඩත්තු කරන බව ද පිළිගැනීම ලබා දෙනුයේ මහජනතාව බවද එසේ පැමිණ මහජනතාවගේ මුදලින් පෝෂණය වෙමින් මහජනතාව බිල්ලට දීම සුදුසු නොවන බවද පවසන ලදී. එමෙන්ම මහජනතාවට අවශ්‍ය කරන සේවාවන් සැපයීම ගරු සභිකයින්ගේ යුතුකම හා වගකීම වන අතර මහජනතාවගේ මුදලින් නඩත්තු වෙමින් මෙම කරන ක්‍රියාවන් සම්බන්ධයෙන් කුහක සිත් ඇති කණ්ඩායමට බක් මහ අකුණු වදින බව පවසන ලදී.

එබැවින් මහජනතාව වෙනුවෙන් ඉටු කිරීමට නියමිත සියලු කටයුතු කිරීම අත්‍යවශ්‍ය බැවින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් මෙම සභාවේ ස්ථිර සේවකයින්ගේ වැටුප් පඩි නඩි ආදිය ගෙවීම හැර ඉතිරි යෝජනා සියල්ල ප්‍රතික්ෂේප කරන බවට කරන ලද යෝජනාව

වෙනුවෙන් බෙදීමක් ඉල්ලා ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද රහස් ඡන්දයක්ද යන්න ගරු සභාපතිතුමන් විසින් විමසා සිටින ලදී.

එහිදී ඒ සඳහා විවෘත ඡන්දයක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දැක්වීමට උත්සහ කළ අවස්ථාවේදී මෙය ඡන්දයක් ප්‍රකාශ කර ඇති අවස්ථාවක් බැවින් අදහස් ප්‍රකාශ කිරීමට විරුද්ධව සභාවේ කෑකෝ ගැසීම් ඇති විය.

ඒ අනුව ගරු වසන්ත ගුණරත්න මැතිතුමා විසින් සභාවේ ස්ථිර සේවකයින්ගේ වැටුප් පඩි නඩි ආදිය ගෙවීම හැර ඉතිරි යෝජනා සියල්ල ප්‍රතික්ෂේප කරමින් ගෙන ආ යෝජනාවට විවෘත ඡන්දයක් පවත්වන ලදී.

එහිදී එම යෝජනාවට පක්ෂව ගරු සභිකයින් 08 දෙනෙක්ද, එනම්

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |

එම යෝජනාවට විපක්ෂව ගරු සභිකයින් 07 දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |

ඡන්දය ප්‍රකාශ කරන ලදී. ඒ අනුව සභාවේ ස්ථිර සේවකයින්ගේ වැටුප් පඩි නඩි ආදිය ගෙවීම හැර ඉතිරි යෝජනා සියල්ල ප්‍රතික්ෂේප කරමින් ගෙන ආ යෝජනාව වැඩි ඡන්ද එකකින් ගරු සභාවේ සම්මත විය.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම යෝජනාවට විරුද්ධ වූ කණ්ඩායම එසේ විරුද්ධ වීමට හේතුව වන්නේ ස්ථිර සේවකයින්ගේ වැටුප් පඩි නඩි ආදිය ගෙවීම හැර ඉතිරි යෝජනා සියල්ල ප්‍රතික්ෂේප කිරීම බව ද විරුද්ධ වූ කණ්ඩායම එම යෝජනාව ඇතුලුව ගරු සභාපතිතුමන් ගෙන ආ ඉතිරි සියලු යෝජනා සම්මත කිරීම සඳහා පක්ෂවන බව ද පවසන ලදී.

එමෙන්ම අද දින සිට නගර සභාව විසින් ඉටු කිරීමට නියමිත මහජන සෞඛ්‍ය හා මහජන උපයෝගීතා කටයුතු නතර කිරීමට සිදු වන බවද එහිදී අලුත් අවුරුදු සමයේ නගරයේ ජනතාව බිල්ලට ගෙන මේ කළ නින්දිත ක්‍රියාවලියට දැඩි සේ විරුද්ධ වන බවද පවසන ලදී.

එමෙන්ම අද රට ගමන් කරනුයේ කුමන දිශාවටද යන්න මහජනතාව තේරුම් ගත යුතු බවත් රට පාලනය කරන ඉහළ නායකත්වයේ සිට පහළ නායකත්වයටම ඇත්තේ රටේ පුරවැසියා හෙම්බත් කරන, බෙල්ලටම හිර කරන රටේ පුරවැසියා නොසළකා හරින පාලන ක්‍රමවේදයක් බවද පැවසූ ගරු සභාපතිතුමා, මෙයින් අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා හා සබරගමු පළාත් ගරු ආණ්ඩුකාරතුමාට මෙහි සම්පූර්ණ අප්‍රසාදය හිමි වන බව ද රටේ විවිධ ප්‍රදේශයන්හි මෙවැනි මන්ත්‍රී කණ්ඩායම් එකතු වී කරන ක්‍රියාවන් නිසා මහජනතාව පීඩාවට පත්වන බව නිරන්තරයෙන් මාධ්‍ය තුළින් දැකීමට ලැබෙන බව ද පවසන ලදී.

තවදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසුවේ ශ්‍රී ලංකාවේ හොඳම නගර සභාව ලෙස පිට පිට තෙවරක් සම්මාන ලබා ගත් අතර හොඳම මූල්‍ය කළමනාකරණය සඳහා වූ සම්මානය ලබා ගෙන ලංකාවේ ආදර්ශමත්ම නගර සභාව හා හොඳින්ම ක්‍රියාත්මක වන නගර සභාව බවට පත්ව ඇති බැවින් නගර සභාව මේ ලෙස කඩාකප්පල් කිරීම පිළිබඳ සොයා බලා බළන්ගොඩ ජනතාව ගෙවන බදු මුදල්වලට සාධාරණයක් කර ජනතාව වෙනුවෙන් අවශ්‍ය කරන සේවා ලබා දීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස අතිගරු ජනාධිපතිතුමාගෙන් ගරු අගමැතිතුමාගෙන් හා ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීම් කරන බව ද පවසන ලදී.

අනතුරුව අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා, මෙම තීන්දුව පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම ලේකම්තුමියගේ වගකීම බවද බලයක් නොමැතිව රැදීසිටීමට උත්සාහ කිරීම තුළ කුහක දේශපාලනය යනු කුමක්ද කියා තේරෙන බවද සාධාරණව සිතන මිනිසුන් මෙම සමාජය තුළ සිටින අතර ඔවුන්ට මෙහි වගකීම භාර දෙන බවද පක්ෂයක් ලෙස ගත යුතු තීරණය අද දින ගත් බවද පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අද දින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරිතුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනා සඳහා ස්තුතිය පළ කරමින් අද දින විශේෂ සභාවේ වැඩ කටයුතු පෙ.ව.10.50ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.